**චක්‍රලේඛ අංක : 35/01/005/0010/20** 2018 සැප්තැම්බර් 19

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත**

## මෝටර්රථ වාහන ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි මත ආන්තික අවශ්‍යතාව

වහාම ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් "අ" ලේඛනයෙහි (අමුණා ඇත) සඳහන් කොට ඇති මෝටර්රථ වාහන අයිතමයන් හැර අනෙකුත් මෝටර්රථ වාහන ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී එම අයිතමයන්වල ආනයන වටිනාකමින් සියයට සියයක් ආවරණය වන පරිදි අවම මුදල් ආන්තිකයක් ණයවර ලිපි විවෘත කරන බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි තැන්පත්කර නොමැති අවස්ථාවකදී ණයවර ලිපි විවෘත නොකළ යුතු බව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම චක්‍රලේඛය යටතේ ආවරණය වන මෝටර්රථ සඳහා පහත සඳහන් කොන්දේසි අදාළ වේ.

1. ඉහත ඡේදයෙහි සඳහන් කොන්දේසිවලට පරිබාහිරව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෝටර්රථ වාහන ආනයනය සඳහා දැනටමත් විවෘත කර ඇති ණයවර ලිපිවල වටිනාකම වැඩි කිරීමට අවසර නොදිය යුතුය.
2. මෙම චක්‍රලේඛය මගින් පනවා ඇති අවම ආන්තික තැන්පතු අවශ්‍යතාව සපුරා ගැනීමට හැකිවන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ආනයන ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් ලබා නොදිය යුතුය.
3. බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් මෙම චක්‍රලේඛයට අනුකූලව ආන්තික තැන්පතු ලබාගෙන ඇති බවට, අදාළ ඉන්වොයිසිය මත පිටසන් කළ යුතුය.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

මෙම විධානයේ උපලේඛන 'අ' https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/DOD_Circular_No_35_01_005_0010_20_e.pdf ඔස්සේ ලබා ගත හැක.